# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

web : www.elections.gov.lk e-mail : info@elections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/NE/ PE/09/2024<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2024.09.27<br>திகதி |

වක්‍රලේඛ අංක PE/2024/07

**ඉතා හදිසි/ ඉතා වැදගත්**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/**
**පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ ආණ්ඩුකාරවර ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**
**කොමිෂන් සභා ලේකම්වරු/ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මාණ්ඩල ප්‍රධානීන් වෙත,**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2024**
***තැපැලෙන් ඡන්දය දීම***

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ, 26 වගන්තියේ විධිවිධානවලට අනුව 2024.11.14 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී තැපැලෙන් ඡන්දය දීම සඳහා වූ පහසුකම් ඉල්ලීමට හිමිකම් ඇති ඡන්ද හිමියන් වෙත එනම්, ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල නිරත වීම හෝ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු වෙනත් අත්‍යවශ්‍ය සේවාවල නිරත වීම හේතුවෙන් තමාට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට නොහැකි වීමට ඉඩ ඇති ඡන්ද හිමියන් සඳහා තැපැලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් සැලසිය යුතු වේ.

02. ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කොට ඇති මුද්‍රිත උපදෙස් මාලාවක් මේ සමඟ එවා ඇත. ඔබ ආයතනයේ තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සම්බන්ධව කටයුතු සම්බන්ධීකරණය සඳහා නිලධාරියකු නම් කොට එම නිලධාරියාට හා සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කරනු ලබන නිලධාරීන්ට මෙම චක්‍රලේඛයේ පිටපත් ලබා දී එහි දක්වා ඇති උපදෙස් කියවා බලා ඒ අනුව ක්‍රියා කරන ලෙස දන්වා සිටිනු මැනවි. ඔහු මඟින් ආයතනයේ සියලුම නිලධාරීන් දැනුම්වත් කොට නියමිත දිනට පෙර සහතික කරන ලද තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුවේ. ***මැතිවරණ රාජකාරිවලින් නිදහස් කර ඇති අය හැර රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මැතිවරණ රාජකාරි සඳහා යොදා ගැනීමට සුදුසුකම් ඇති අනෙකුත් සියලුම නිලධාරීන් තැපැල් ඡන්ද ඉල්ලුම් කළයුතු අතර තැපැල් ඡන්ද අයදුම්කර නොතිබීම මෙන්ම අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබීම ද මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීමට හේතුවක් නොවේ.***

03.1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධානවලට අනුව පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් වූ ජනාධිපතිවරයාගේ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2024.09.24 දින සිට දින හතත් දාහතරත් අතර කාලය ඇතුළත තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලැබිය යුතුය. ඒ අනුව ඉල්ලුම්පත් භාර ගැනීම 2024.10.01 දින ආරම්භ වී 2024.10.08 දින අවසන් වීමට නියමිත ය.

ඒ අනුව ඔබගේ ආයතනයේ සේවයේ නියුතු සහ තැපැල් ඡන්ද ඉල්ලුම කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති සියලු දෙනාගේම අයදුම්පත් 2024.10.08 දින හෝ එදිනට පෙර හෝ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත ලැබී තිබිය යුතුය. අයදුම්පත්‍ර භාර ගැනීම අවසන් දිනයේ දී එනම්, 2024.10.08 දින මධ්‍යම රාත්‍රී 12.00ට පෙර නියමිත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබිය යුතු අතර, එදිනට අයදුම්පත්‍ර තැපැලට භාරදීම පමණක්, එම අයදුම්පත්‍ර පිළිගැනීම සඳහා හේතුවක් නොවේ.

04. තැපැල් ඡන්ද සඳහා හිමිකම් ඇති අය
පනතේ 26(2) වගන්තිය අනුව තැපැල් ඡන්ද දායකයෙකු ලෙස සලකනු ලැබීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් ;

4.1 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින්, ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්;

4.2 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

4.3 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

4.4 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

4.5 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

4.6 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයේ නිලධාරීන් හා සේවකයින්;

4.7 අපේක්ෂකත්වය නිසා තමාට වෙන්කරන ලද ඡන්ද පොළේ දී ඡන්දය දීමට ඉඩක් නොලබන අපේක්ෂකයින්;

4.8 ඡන්ද විමසීමේ දිනයේ දී ඡන්ද විමසීම් හා සම්බන්ධ කාර්යයන් සඳහා නියුක්ත කිරීමට අපේක්ෂිත පළාත් පාලන, පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හා සේවකයින්;

4.9 ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුභවතුන්;

4.10 මීට අමතරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් කැටුව යන සහායකවරුන් ලෙස කටයුතු කරන රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් වේ. (උදා: කාර්යාල කාර්ය සහායක, මැනුම් සහායක, පාසල් කම්කරුට ද තැපැල් ඡන්ද පහසුකම් ලබාදීමට තීරණය කර ඇත.)

05. තවද ඉහත සඳහන් ආයතනවල නිලධාරීන්ට පරිබාහිරව 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 129 වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තෝරාගත් අත්‍යාවශ්‍ය සේවා සපයන ආයතනවල ඡන්ද විමසීම් දිනයේ රාජකාරිවල නියුක්ත කරවීමට අපේක්ෂිත නිලධාරීන්ට පමණක් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ලබාදීමට තීරණය කොට ඇත. **මේ පිළිබඳව එම ආයතනවල ප්‍රධානීන්/ ප්‍රාදේශීය ප්‍රධානීන් පූර්ණ අවධානය යොමු කළ යුතු අතර ඡන්ද විමසීම් දිනයේ පෙ.ව. 7.00 - ප.ව. 4.00 දක්වා කාලය තුළ තමාට වෙන්කරන ලද ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි දුරින් ස්වකීය ඡන්ද පොළ පිහිටා ඇති සහ ඡන්ද විමසීම් දින අත්‍යාවශ්‍ය රාජකාරිවල අනිවාර්යයෙන්ම සේවයේ නියුක්ත කරවීමට අපේක්ෂිත නිලධාරීන්ට පමණක් මෙම හිමිකම ලබාදෙනු ලබයි. එහෙයින් ඡන්ද විමසීම් දින ඔවුන් සේවයේ යොදවා ගන්නා බව එකී ආයතන ප්‍රධානීන් නිසැක විය යුතු අතර අදාළ නිලධාරීන්ගේ අයදුම්පත්‍ර පිළිබඳව පෞද්ගලික අවධානය යොමු කොට ක්‍රියාකළ යුතු අතර එකී අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ආවරණ ලිපියක් සහිතව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත යැවිය යුතු වේ.**

06. මැතිවරණ රාජකාරිවලින් නිදහස්කර ඇති නිලධරයන්

6.1 කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ ඒ හා සමාන තනතුරු දරන නිලධරයන්

6.2 ඡන්ද විමසීම් රාජකාරි සඳහා දුර බැහැර ගමන් කිරීමට අපහසු හෝ ඡන්ද විමසීම් රාජකාරි ඉටු කිරීමට අපහසු තරම් ආබාධිත තත්ත්වයෙන් පසුවන නිලධරයන්

6.3 මෙම චක්‍රලේඛයේ නිකුත්වන දින සිට මාස 06 ක කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධරයන්

6.4 බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා වෙනත් ආගමික පූජකවරුන්

6.5 ගර්භනී අවස්ථාවේ පසුවන නිලධාරිනියන් හා මවුකිරි ලබා දෙන ළදරුවන් සිටින නිලධාරිනියන් හා මැතිවරණ රාජකාරී වල යෙදවීමට නොහැකි තරම් බරපතල අසනීප තත්ත්වයේ පසුවන නිලධරයන් ආදී ඉහත කාණ්ඩවල නිලධරයන් හා යම්කිසි පිළිගත හැකි හේතුවක් නිසා මැතිවරණ රාජකාරිවලින් නිදහස් කර ඇති නිලධරයන් තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම කිසිසේත්ම නොකළ යුතු අතර සහතික කිරීමේ නිලධාරීන් විසින් එම තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සහතික කිරීම නොකළ යුතුය.

6.6 නිලධාරියා හෝ කලත්‍රයා මෙම ඡන්ද විමසීමේදී හෝ පෙර ඡන්ද විසමීම්වල දී අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වී තිබීම

07. තැපැල් ඡන්ද දායකයන්ගේ පහසුව සඳහා මැතිවරණයට වලංගු ඡන්දහිමි 2024(1)CR නාමලේඛනය 2024.09.30 දින සිට පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇති අතර තැපැල් ඡන්ද අයදුම්පත්‍ර ද එකී ස්ථාන වල තබා ඇත.

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල
- සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල

} අදාළ බල ප්‍රදේශයට අයත් වන ඡන්ද ප්‍රදේශයේ නාමලේඛනය

ඉහත සඳහන් ස්ථානවලට අමතරව,

- රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය කොළඹ 07
- කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.
- අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 243/3/ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
- තැපැල් මූලස්ථානය, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මාලිගාවත්ත.
- සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණය, බත්තරමුල්ල යන කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාලවල ඡන්දහිමි නාමලේඛන තොරතුරු පරිගණක ආශ්‍රයෙන් අයදුම්කරුවන් වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

08. තැපැල් ඡන්ද අයදුම් කිරීම.

8.1 මෙම පාර්ලිමේන්තු මැතිවරණයේ දී තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීම මතු දැක්වෙන ප්‍රධාන ආකාර මඟින් සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කොට ඇත. පහත අංක 8.1.1, 8.1.2 හා 8.1.3 සඳහා සවිස්තරාත්මක මඟ පෙන්වීමේ උපදෙස් මේ සමඟ අමුණා ඇත.(PE/2024/09/A)

**8.1.1 ස්වයං මාර්ගගත අයදුම් කිරීම (Self – Online Applying) (නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මකයි)**

මෙහිදී තැපැල් ඡන්ද අයදුම්කරුම තමාගේ තොරතුරු සහ නියමිත සහතික කිරීමේ නිලධාරියාගේ තොරතුරු මැතිවරණ ඊ - සේවාව (https://eservices.elections.gov.lk) ඔස්සේ ඇතුළත් කොට අයදුම් කිරීමට අවස්ථාව ලබාදේ. එසේ මාර්ගගතව මැතිවරණ ඊ - සේවාව තුළින් සම්පූර්ණ කොට බාගත කර ගන්නා අයදුම්පතේ මුද්‍රිත පිටපත් (අයදුම්කරුගේ සහ සහතික කිරීමේ නිලධාරිගේ තොරතුරු ද ඇතුළත්) සහතික කිරීමේ නිලධාරී විසින් සහතික කොට අදාළ මැතිවරණ කාර්යාලය වෙත යොමු කළ යුතු වේ. මේ ක්‍රමවේදය සඳහා අයදුම්කරු විසින් ඊ - සේවාව ගිණුමක් (User Account) සකස් කර ගත යුතුය.

**8.1.2 ආයතනික මාර්ගගත අයදුම් කිරීම (Certifying Officer Online Applying) )**

ආයතනයේ තැපැල් ඡන්ද අයදුම්කරන සියලු නිලධාරීන්ගේ තොරතුරු (සහතික කිරීමේ නිලධාරියාගේ ද තොරතුරු සහිතව) සහතික කිරීමේ නිලධාරී හෝ සහතික කිරීමේ නිලධාරිගේ සහායකයෙකු විසින් මැතිවරණ ඊ - සේවාව මඟින් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අදාළ අයදුම්පත් සියල්ල බාගත කොට සහතික කර අදාළ මැතිවරණ කාර්යාලය වෙත යොමු කිරීම සිදු කළ යුතුය. මෙය ආයතනයේ සහතික කිරීමේ නිලධාරියාට අදාළ ඊ - සේවාව ගිණුම මඟින් සිදු කළ යුතු වේ.

**8.1.3 දත්ත මුද්‍රණය කර ගැනීමේ ක්‍රමය (අර්ධ මාර්ගගත ක්‍රමය) (Semi online data Printing Applying)**

ඉහත 8.1.1 හෝ 8.1.2 ක්‍රම භාවිතා කිරීමට නොහැකි වන අවස්ථාවලදී මැතිවරණ ඊ- සේවාව මඟින් තැපැල් ඡන්ද අයදුම්කරුගේ හැඳුනුම්පත් අංකය පමණක් ඇතුළත් කොට අයදුම්කරු විසින්ම මාර්ගගතව අයදුම්පත සකසා ගැනීම කළ හැකි වේ.

අයදුම්කරු විසින් මාර්ගගතව සකසා මුද්‍රණය කරගත් අයදුම්පත සහතික කිරීමේ නිලධාරි වෙත ලබාදුන් පසු සහතික කිරීමේ නිලධාරී විසින් සහතික කිරීමේ නිලධාරීගේ තොරුතුරු ද සම්පූර්ණ කොට සහතික කිරීමෙන් අනතුරුව අදාළ මැතිවරණ කාර්යාලය වෙත යොමු කිරීම කළ යුතු වේ.

8.2. නිල වෙබ් අඩවිය හරහා අයදුම්පත ලබා ගැනීම.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට (https://elections.gov.lk) පිවිස එහි ඇති තැපැල් ඡන්ද අයදුම් කිරීමේ අයදුම්පත්‍රය බාගත කොට මුද්‍රණය කර අයදුම්කරුට අදාළ තොරතුරු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සහතික කිරීමේ නිලධාරියා විසින් ස්වකීය තොරුතුරු ඇතුළත් කොට අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත එවිය යුතු වේ.

8.3 මුද්‍රිත අයදුම්පත ලබා ගැනීම (සාමාන්‍ය ක්‍රමවේදය)

මැතිවරණ කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබන මුද්‍රිත අයදුම්පතක් පුරවා සහතික කිරීමේ නිලධාරී මඟින් මැතිවරණ කාර්යාලය වෙත එවීම.

8.4 ජාතික හැඳුනුම්පත් අංකය ඡන්දහිමි නාමලේඛනයේ සටහන්ව නොමැති අයදුම්කරුවන්ට ඡන්දහිමි නාමලේඛන පොත් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන ඉහත අංක 07 හි සඳහන් ස්ථානයකින් තොරතුරු ලබා ගැනීමට සිදු වේ.

8.5 එක හා සමාන පුද්ගල නාම පවතින හෙයින් තමන්ගේ තොරතුරු වෙනත් අයකු ලවා පරීක්ෂා කොට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් වළකින ලෙස තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට දැනුම්දීමට කටයුතු කළ මැනවි.

09. තැපැල් ඡන්ද අයදුම්පත් සහතික කිරීම.

9.1 තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් විසින් තමාට ලැබෙන තැපැල් ඡන්ද අයදුම්පත් අදාළ ඡන්දහිමියාගේ ආසන්නතම ප්‍රධානියාගේ සහතිකය සමඟ ලැබී ඇති බවට නිසැක විය යුතු අතර, සහතික කිරීමේ නිලධාරී වශයෙන් තමාගේ නම සහ රාජකාරි ලිපිනය සහිත නිල මුද්‍රාව සහ අත්සන තබා සහතික කළ යුතුය. ඡන්දහිමියා සහතික කිරීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන අවස්ථාවක තමාටම තම අයදුම්පත සහතික කළ හැකිය.

9.2 තැපැල් ඡන්ද අයදුම්පත්‍ර ඉදිරිපත් කරනු ලබන සෑම කාර්යාලයක් සඳහා වූ විශේෂ කේත අංකයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කොට ඇත. මෙම කේත අංකය සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීමේ අයදුම්පත්‍රයේ සටහන් කිරීම කළ යුතුය. එක් එක් කාර්යාලයට අයත් කේත අංක මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විමසීමෙන් ලබාගත හැකිය. (පසුගිය ජනාධිපතිවරණයේදී භාවිතා කළ ආයතන කේතයන් ඒ ආකාරයෙන්ම භාවිතා කළ හැකිය)

10. තැපැල් ඡන්ද අයදුම්පත් යැවිය යුතු ලිපිනය

10.1 සහතික කරනු ලබන තැපැල් ඡන්ද අයදුම්පත් එදිනම නොවරදවාම නියමිත තේරීම්භාර නිලධාරී වෙත තැපැල් මඟින් යැවිය යුතුය. මේ සඳහා නිදහස් තැපැල් පහසුකම් ලබාදෙනු ලබන බැවින් මුද්දර ඇලවීමක් අවශ්‍ය නොවේ. "ප්‍රමුඛ සේවා" ලේබලය හෝ එම වගන්තිය ලිපි කවරයෙහි පැහැදිලිව සටහන් කිරීම ප්‍රමාණවත් වේ. සහතික කරන ලද තැපැල් ඡන්ද අයදුම්පත් එකිනෙක පරීක්ෂා කර තැපැල් ඡන්දහිමියාගේ ඡන්දය ලියාපදිංචි දිස්ත්‍රික්කයේ (මැතිවරණ කාර්යාලයෙහි) තේරීම්භාර නිලධාරී වෙත යැවිය යුතුය.

10.2 තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පසුව තැපෑලෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත. එමනිසා තැපැල් ඡන්ද අයදුම් කිරීම අවසන් දිනයේ දී සහතික කරනු ලබන තැපැල් ඡන්ද අයදුම්පත් තැපෑලට යොමු කිරීමෙන් නියමිත දිනට පෙර තේරීම්භාර නිලධාරී වෙත ලැබීමේ ගැටලු ඇති විය හැකි බැවින්, අවසන් දින 02ක තුළ දී සහතික කරන අයදුම්පත් තම කාර්යාලය පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත අතින් රැගෙන ගොස් භාරදීමට කටයුතු කරන ලෙස සහතික කිරීමේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන්නේ නම් මැනවි. එලෙස දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට භාරදෙන අයදුම්පත් අයදුම්කරුවන්ගේ ලියාපදිංචි දිස්ත්‍රික්ක අනුව වෙන වෙනම කවර වල බහා භාරදිය යුතුවේ.

10.3 ඒ ඒ දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාලයීය ලිපින දැක්වෙන ලේඛනයක් මේ සමඟ ඇමුණුම් II ලෙස යාකර එවා ඇත.

11. **සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීම.**

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති (ඇමුණුම I) භාවිතා කළ යුතු අතර, **අදාළ සහතික කිරීමේ නිලධාරීන්ගේ පත්වීම් ලිපි ආයතනය පිහිටි දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත පමණක් යැවිය යුතු බව දන්වා සිටිමි. එම පත්වීම් ලිපි රාජගිරිය සරණ පාරේ පිහිටි <u>මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට එවීමෙන් වැළකෙන ලෙසත්</u> දන්වා සිටිමි. මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට යොමු කරනු ලබන මෙවැනි කිසිදු පත්වීම් ලිපියක් නැවත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට යොමු කිරීමට මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය කටයුතු නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.**

11.1 යම් ආයතනයක අයදුම්කරුවන් විශාල ප්‍රමාණයක් සිටින විට අදාළ ආයතන ප්‍රධානීන් විසින් සහතික කිරීමේ නිලධාරීන් කිහිප දෙනෙකු පත්කිරීම අවශ්‍ය වන අතර, පසුගිය ඡන්ද විමසීම්වල දී සහතික කිරීමේ නිලධාරීන්ගේ තොරතුරු හා ලේඛන භාවිතයෙන් මෙම මැතිවරණය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් සහතික කිරීමේ නිලධාරීන් පත් නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

11.2 පසුගිය ඡන්ද විමසීම්වලදී සහතික කිරීමේ නිලධාරීන් ලෙස කටයුතු කර ඇති උනන්දුවෙන් හා නිවැරදිව කටයුතු කළ අත්දැකීම් සහිත නිලධාරීන්ට ප්‍රමුඛත්වයක් ලැබෙන පරිදි මාණ්ඩලික නිලධාරීන් පත්කිරීම සුදුසු වේ.

11.3 පසුගිය ජනාධිපතිවරණයේදී චෝදනාලත් හෝ නොසැලකිල්ලෙන් කටයුතු කළ සහතික කිරීමේ නිලධාරීන් මෙවර එම තනතුරු සඳහා පත් නොකිරීමට වගබලා ගැනීම වැදගත් වේ.

11.4 තැපැල් මඟින් ලැබෙන රක්ෂණ කවර සුරක්ෂිතව තමා භාරයේ තබා ගැනීමට පහසුකම් ඇති නිලධාරියකු මේ සඳහා පත් කිරීම යෝග්‍ය වේ.

11.5 තැපැල් ඡන්දහිමියන්ට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක පිහිටි කාර්යාලයක අයකු එම තැපැල් ඡන්දහිමියන්ට සහතික කිරීමේ නිලධාරී වශයෙන් පත් කිරීම ද වැදගත් වේ.

11.6 විශේෂ දේශපාලන සම්බන්ධතා ඇති පුද්ගලයන් සහතික කිරීමේ නිලධාරී වශයෙන් පත් නොකිරීමට ද වගබලා ගත යුතුය.

11.7 තැපැල් ඡන්ද සම්බන්ධයෙන් පූර්ණ වගකීම සහතික කිරීමේ නිලධාරී වෙත පැවරෙන බැවින් වගකීම දැරීමට හැකි නිලධාරීන් පමණක් සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීමට ද ක්‍රියා කළ යුතුය.

11.8 තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය හා කාර්යාලයීය කේත අංකය අනිවාර්යයෙන්ම අයදුම්පතෙහි සටහන් කිරීමට ක්‍රියා කළ යුතුය.

11.9 තැපැල් ඡන්ද සලකුණු කිරීම උපරිම දින දෙකකට සීමා කරන බැවින් එක් නිලධරයකු සඳහා උපරිම වශයෙන් තැපැල් ඡන්ද 200-250 ක් පමණ සහතික කිරීමට පැවරීම සුදුසු ය.

11.10 තැපැල් ඡන්ද පාවිච්චි කිරීමේ දිනයට පෙර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට, විදේශගත වීමට නියමිත නිලධාරීන්, සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

11.11 සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කරනු ලබන නිලධාරීන් මෙම දිනවල දී නිරතුරුව කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර ක්ෂේත්‍ර රාජකාරි යොදා ගැනීමෙන් වැළකී සිටීමට හැකිතාක් දුරට ක්‍රියා කිරීම වඩාත් යෝග්‍ය බව දන්වා සිටිනු ලැබේ.

12. තැපැල් ඡන්ද සහතික කරන නිලධාරීන්ට තමන් විසින් සහතික කරන ලද අයදුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබා දිය යුතු අතර, තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සහතික කළ පසු ඒවා පිළිගත්/ ප්‍රතික්ෂේප කළ බව දැන්වීම හා පිළිගත් තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු පැකැට්ටු එවීම සඳහා සහතික කිරීමේ නිලධාරීන්ගේ නම, තනතුර, කාර්යාල කේත අංකය, කාර්යාල ලිපිනය (අනිවාර්යයෙන්ම නිල මුද්‍රාව මඟින්) ඉල්ලුම් පත්‍රයෙහි සටහන් කරන ලෙස ද උපදෙස් ලබා දෙන්න. (ඇමුණුම් III)

13. සම්පූර්ණ කර ඇති තැපැල් ඡන්ද අයදුම්පත්වල තොරතුරු නිවැරදි බවට නිසැක වී සහතික කිරීමේ නිලධාරී විසින් සහතික කිරීමෙන් පසුව ඒවා නියමිත දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවිය යුතුය. එසේම එක් අයදුම්කරුවෙක් සඳහා අයදුම්පත් එකකට වැඩි ගණනක් නිර්දේශ කිරීම හා ව්‍යාජ තොරතුරු ඇතුළත් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනු ලැබේ.

තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම, ඒවා ඉදිරිපත් කිරීම හා සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීමට අදාළ කරුණු පමණක් මෙම චක්‍රලේඛයෙන් දන්වා ඇති අතර තැපැල් ඡන්ද ක්‍රියාවලියට අවැසි සෙසු උපදෙස් හා කාර්ය පටිපාටි සහතික කිරීමේ නිලධාරීන් වෙනුවෙන් ඉදිරියේ දී පවත්වනු ලබන උපදෙස් ලබාදීමේ සාකච්ඡාවල දී තේරීම්භාර නිලධාරීන් විසින් ලබාදෙනු ඇත. තේරීම්භාර නිලධාරී විසින් පවත්වනු ලබන උපදෙස් සැසි සඳහා සහතික කිරීමේ නිලධාරීන් සහභාගී වීම අත්‍යවශ්‍ය බව ඔවුනට දැනුම්දීමට කටයුතු කරන ලෙස හා මේ පිළිබඳව යම් විමසීමක්/ වැඩිදුර කරුණු පැහැදිලි කර ගැනීමක්

වෙතොත් වහාම මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය වෙතින්/ අදාළ දිස්ත්‍රික් කාර්යාලය වෙතින් ලබාගන්නා ලෙස දන්වා සිටිනු රිසියෙමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. සියලුම තේරීම්භාර නිලධාරීන්
02. සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත } දැනගැනීම හා දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීම පිණිස
03. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැනගැනීම පිණිස



සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி :011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
*e-mail : chairman@elections.gov.lk*
*e-mail : comelesl@sltnet.lk*


මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
*e-mail: cge@elections.gov.lk*

අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
மேலதிக தேர்தல்கள் ஆணையாளர் (தேசியத் தேர்தல்கள்)
දුරකථන/தொலைபேசி : 011-2868447
ෆැක්ස්/தொலைநகல் :011-2868368


PE/2024/09/A

# මැතිවරණ ඊ-සේවා ගිණුමක් සාදා ගැනීම

01. මැතිවරණ ඊ-සේවා ගිණුමක් සාදා ගැනීම සඳහා https://eservices.elections.gov.lk යන මැතිවරණ ඊ-සේවා වෙබ් අඩවියට පිවිස එහි **SignUp** වෙත යොමු වන්න.




02. එවිට ගිණුම සකසා ගැනීම සඳහා ගිණුම සකසා ගන්නා අයගේ තොරතුරු ඇතුළත් කළ යුතු තිරයට යොමු වේ.




03. එහි ඉල්ලා ඇති තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් ඇතුළත් කරන්න. මේ සඳහා ගිණුම සකස් කරගන්නා අයගේ පුද්ගලික තොරතුරු ඇතුළත් කළ යුතුය. කිසිදු හේතුවක් මත රාජකාරී තොරතුරු හෝ වෙනත් අයෙකුට අයත් තොරතුරු ඇතුළත් නොකළ යුතුය.

මෙහි දී,

**SLIN / NIC:**

ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කරන්න. එය යළි කිහිප වාරයක් නිවැරදිම දැයි පරීක්ෂා කර බලන්න. එම හැඳුනුම්පත් අංකය ඇතුළත් කළ විට එය අනුසාරයෙන් ඔබට පරිශීලක ගිණුම නාමය ස්වයංක්‍රීයව සැකසෙන අතර එය User Name යන ස්ථානයේ දිස් වේ. මෙම පරිශීලක නාමය ඔබගේ හැඳුනුම්පත් අංකයට සමාන අංක 12කින් යුක්ත වූවකි. එය වෙනස් කිරීමේ හැකියාවක් නැත.

**Registered Mobile No :**

යටතට ඔබටම අයත් නිතර භාවිතයේ පවතින ජංගම දුරකථන අංකය ඇතුළත් කරන්න. ගිණුමට අදාළ ඉදිරි තොරතුරු කෙටි පණිවුඩ ලෙස මෙම අංකයට ලැබේ.


**Email :**

යටතට ඔබටම අයත් නිතර භාවිතයේ පවතින පුද්ගලික ඊ-තැපැල් (විද්‍යුත් තැපැල්) ලිපිනය ඇතුළත් කරන්න. ඔබගේ කාර්යාලීය හෝ වෙනත් ඊ-තැපැල් (විද්‍යුත් තැපැල්) ලිපින ඇතුළත් කිරීමෙන් වලකින්න.


**Password :**

යටතට කිසිවකුට අනුමාන කළ නොහැකි, ඔබට පහසුවෙන් මතක තබා ගත හැකි ශක්තිමත් මුරපදයක් සකසා ඇතුළත් කරන්න. ඉදිරි කටයුතුවලදී ඔබගේ පරිශීලක නාමය සමඟ භාවිතා කළයුතු වන්නේ මෙම මුරපදයයි. මුරපදය ඇතුළත් කළ පසු **Password (Retype)** යන ස්ථානයට යලිත් එම මුරපදයම ඇතුළත් කරන්න.


04. ඉන්පසු පහත ස්ථානයන් හි ☑ සලකුණු කොට **Sign Up** බොත්තම මත ක්ලික් කරන්න.




05. එවිට ඔබ ඇතුළත් කළ ජංගම දුරකථන අංකයට සත්‍යාපන කේතය ලැබෙන අතර එය ඇතුළත් කළ හැකි වන පරිදි තිරය වෙනස් වේ.



06. එම ස්ථානයට ඔබේ ජංගම දුරකථන අංකයට ලැබුණු කේතය ඇතුළත් කරන්න. එවිට ගිණුම සාර්ථකව සැකසී අවසන් වන අතර ගිණුමට ඇතුළු වීම සඳහා පරිශීලක නාමය හා මුරපදය විමසන තිරය ලැබේ.




07. එයට ඔබේ පරිශීලක නාමය (ඉලක්කම් 12 යුතු අංකය) හා ඔබ සකසා ගත් මුරපදය ඇතුළත් කර ඉදිරි කටයුතු සඳහා ගිණුමට පිවිසෙන්න.

ඇමුණුම I

PE/2024/30/01/F1
(ආදර්ශය)

කාර්යාල ලිපිනය - ..........................................
..........................................
..........................................
..........................................
දිනය 20........../........../.........

දිස්ත්‍රික් භාරකාර නිලධාරී,
..................................දිස්ත්‍රික්කය

## පාර්ලිමේන්තු මැතිවරණ - 2024
## තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී පත් කිරීම

01. ආයතනයේ නම -..........................................................................................................

02. (අ) තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධරයාගේ නම..........................................................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(ඇ) කාර්යාලීය කේත අංකය *

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ■ | | | | | | ■ | | | |

(ඈ) සහතික කිරීමේ නිලධාරියාගේ කේත අංකය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ■ | | | | | | ■ | | | | ■ | |

03. තනතුර- ..........................................................................................................

04. (අ) සහතික කිරීමේ නිලධරයාගේ කාර්යාලයේ පිහිටි දිස්ත්‍රික්කය -..........................................

(ආ) රාජකාරි ලිපිනය -..........................................................................................

(ඇ) රාජකාරි දුරකථන අංකය -...................................................................................

05 (අ) පෞද්ගලික ලිපිනය - ........................................................................................

(ආ) දුරකථන අංක (ජංගම) - ....................................................................................

06. නිලධරයාගේ ආදර්ශ අත්සන හා නිල මුද්‍රාව - ..............................................................

ආදර්ශ අත්සන [ ] නිල මුද්‍රාව [ ]

07. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී වශයෙන් ඉහත නිලධාරී තැන දළ වශයෙන් කොතරම් තැපැල් ඡන්ද දායකයින් ප්‍රමාණයකට (සංඛ්‍යාවකට) අදාළව මෙම රාජකාරි ඉටු කරන්නේ ද යන වග-
..........................................................................................................

08. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -
ඉහත විස්තර සඳහන් නිලධාරී තැන පාර්ලිමේන්තු මැතිවරණය 2024 වෙනුවෙන් තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධරයෙකු වශයෙන් මෙයින් පත්කරමි. ඔහුට ඇයට අදාළ රාජකාරි සම්බන්ධයෙන් ඔහු/ ඇය දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් මෙයින් දන්වමි.

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී පත්කරනු ලබන ආයතන ප්‍රධානියාගේ
නම -......................................................................................
ජාතික හැඳුනුම්පත් අංකය - ....................................................
තනතුර - ..................................................
දුරකථන අංක - කාර්යාලය: .................. ජංගම : ..................ෆැක්ස්: ..................
- ඉ - තැපැල :..............................
අත්සන - ............................................
නිල මුද්‍රාව - ............................................

(මෙම ආකෘතියේ සියලු විස්තර සම්පූර්ණ කළ යුතු ය)

* මෙම කේත අංකය WWW.elections.gov.lk වෙබ් අඩවියෙන් හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබා ගැනීමට අවකාශ සලසා ඇත.

ඇමුණුම II

තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු දිස්ත්‍රික් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලය

| | ලිපිනය | | දුරකථන අංක | | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ෆැක්ස් අංකය |
|---|---|---|---|---|---|
| | | | දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | |
| 01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කොළඹ | 0112369134 | 011-2369437/38 | 011-2369279/481 |
| 02 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගම්පහ | 0332222235 | 033-2222047 | 033-2222047 |
| 03 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කළුතර | 0342222235 | 034-2222266 | 034-2222247 |
| 04 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මහනුවර | 0812222233/35 | 081-2233187 | 081-2233190 |
| 05 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මාතලේ | 0662222236 | 066-2222422 | 066-2222422 |
| 06 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | නුවරඑළිය | 0522222235 | 052-2222325 | 052-2222325 |
| 07 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගාල්ල | 0912222233/ 0912222235 | 091-2234028 | 091-2234018 |
| 08 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මාතර | 0412222235 | 041-2222305 | 041-2222305 |
| 09 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | හම්බන්තොට | 0472256235 | 047-2256248 | 047-2256495 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | යාපනය | 0212222235 | 021-2222655 | 021-2228002 |
| 11 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කිලිනොච්චිය | 0212283945 | 021-2285664 | 021-2285667 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වවුනියාව | 0242222235 | 024-2222311 | 024-2222311 |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මන්නාරම | 0232222235 | 023-2222289 | 023-2222289 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මුලතිව් | 0212290035 | 021-2061426 | 021-2061426 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මඩකලපුව | 0652224435 | 065-2224312 | 065-2224374 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අම්පාර | 0632222233 | 063-2224342 | 063-2224342 |
| 17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ත්‍රිකුණාමලය | 0262222235 | 026-2222304 | 026-2224975 |
| 18 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කුරුණෑගල | 0372222235 | 0372222369 | 037-2221549 |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පුත්තලම | 0322265235 | 032-2265246 | 032-2265246 |
| 20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අනුරාධපුරය | 0252235479 | 025-2222551 | 025-2222551 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පොළොන්නරුව | 0272222235 | 027-2222012 | 027-2222012 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බදුල්ල | 0552222235 | 055-2222424 | 055-2222424 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මොණරාගල | 0552276235 | 055-2276315 | 055-2276291 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රත්නපුරය | 0452222237 | 045-2222023 | 045-2223059 |
| 25 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කෑගල්ල | 0352222235 | 035-2222561 | 035-2233050 |

ඇමුණුම III

## පාර්ලිමේන්තු මැතිවරණ - 2024
## තැපැල් ඡන්ද අයදුම් කිරීම පිළිබඳ තොරතුරු

| අනු අංකය | තැපැල් ඡන්දදායකයාගේ නම | තනතුර | රාජකාරි ලිපිනය | සහතික කිරීමේ නිලධාරී වෙත තැපැල් ඡන්ද අයදුම් පත්‍ර ඉදිරිපත් කළ දිනය | තැපැල් ඡන්ද අයදුම්පත් අදාළ තේරීම්භාර නිලධාරී වෙත යවන ලද දිනය | තැපැල් ඡන්දදායකයා ලියාපදිංචියට අදාළ විස්තර | | | | තේරීම්භාර නිලධාරී විසින් අයදුම්පත්‍ර පිළිගත් බව/ ප්‍රතික්ෂේප කළ බව දන්වා ඇත්නම් ඒ තීරණ ලිපියේ විස්තර | තැපැල් ඡන්ද පත්‍රිකාව අඩංගු රක්ෂණ කවරය ලැබුන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | පරිපාලන දිසත්‍රික්කය | මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | ඡන්ද කොට්ඨාසයේ අංකය | පිළිවෙල අංකය | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

කාර්යාලයීය කේත අංකය | | | | | | | | | | | |

# පී.ඊ. 2/එස්.

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
## තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීම

(ආකෘතිය සම්පූර්ණ කිරීමට පෙර පසුපිට සටහන සහ උපදෙස් බලන්න.)

"අ" ආකෘතිය

අංක..............දරන.................................. මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා වෙත,

.................................................................................... (වන) | | | | | | | | | | | | |

(නම)

දරන ජාතික හැඳුනුම්පත හිමි මම, පූර්වෝක්ත මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයෙහි .................................... ................................................................................................................................................ යනුවෙන් මගේ නම දැක්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

**දැනට වලංගු ඡන්ද හිමි නාමලේඛනයේ මගේ නම ලියාපදිංචියට අදාළ විස්තර පහත දැක්වේ :**

| | | | |
|---|---|---|---|
| පරිපාලන දිස්ත්‍රික්කය: | | ග්‍රාම නිලධාරි කොට්ඨාසය: | |
| ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය හා නම: | | වීදියේ / ගමේ නම: | |
| ඡන්ද කොට්ඨාසයේ අංකය: | | මගේ නමට අයත් අනුක්‍රමික අංකය: | |
| ගෘහ මූලිකයාගේ නම: | | | |

* (1) *(අ) ශ්‍රී ලංකා යුද හමුදාවේ* / ශ්‍රී ලංකා නාවික හමුදාවේ* / ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන්;

*(ආ) පොලිස් දෙපාර්තමේන්තුවේ* / බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ* / ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ* / තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ* / ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ*/ .............................................................................................................. ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්;

*(ඇ) තෝරා පත්කර ගැනීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත්කරනු ලැබූ* / පත්කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්;

*(ඈ) ඒ තෝරා පත්කර ගැනීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත්කරනු ලැබූ* / පත්කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්;
මගේ සේවා නියුක්තියේ විශේෂ අවස්ථානුගත කරුණුවල හේතුවෙන්;

*(2) අංක .......................... දරන...................................................මැතිවරණ කොට්ඨාසය සඳහා මා අපේක්ෂකයකු වීම හේතුවෙන්,

මට වෙන්කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් මට ඡන්දය දීමට නොහැකි* / නොහැකි වීමට ඉඩ ඇති බැවින්, ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා මන්ත්‍රීවරයන් තෝරාපත්කර ගැනීමේ දී තැපැල් ඡන්දදායකයකු වශයෙන් සළකනු ලැබීමට මම මෙයින් ඉල්ලුම් කරමි.

මගේ ඡන්ද පත්‍රිකාව සහ අනිකුත් ලේඛන එවනු ලැබිය යුතු ලිපිනය පහත දැක්වේ :

පසු පිටේ දැක්වෙන සටහන ප්‍රකාර සහතික කිරීමේ නිලධරයකු වශයෙන් ක්‍රියා කිරීමට ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති නම්, ඉල්ලුම්කරුගේ සහතික කරන නිලධරයාගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න. } ..........................................................
..........................................................
..........................................................

සහතික කිරීමේ නිලධරයකු වශයෙන් ක්‍රියාකිරීමට ඉල්ලුම්කරුට හිමිකම් තිබේ නම්, ඉල්ලුම්කරුගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න. } ..........................................................
..........................................................

..........................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දුරකථන අංකය: රාජකාරි: .................................... තනතුර: ..........................................................
පෞද්ගලික:.................................... රාජකාරි ලිපිනය: ..........................................................
දිනය: ..................................

> ඉල්ලුම්කරු, සහතික කිරීමේ නිලධරයාගේ කාර්යාලයේම/ ආයතනයේම/විද්‍යාලේම සේවය නොකරන්නේ නම් ඉල්ලුම්කරුගේ අනන්‍යතාව සම්බන්ධයෙන් සහතික කිරීමේ නිලධරයා සෑහීමකට පත්වීම සඳහා පසුපිටේ දැක්වෙන සහතිකය, ඉල්ලුම්කරුගේ කාර්යාලයේ / ආයතනයේ / විද්‍යාලේ ප්‍රධානියා විසින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍යය. (උදාහරණ :- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කිරීමේ නිලධාරියා වන අවස්ථාවක ගුරුවරුන් සම්බන්ධයෙන් එම ගුරුවරුන් සේවය කරන විද්‍යාලේ විද්‍යාල්පති විසින් පසුපිටේ සඳහන් සහතිකය සම්පූර්ණ කළ යුතුයි.)

1. ඉල්ලුම්කරු තැපැලෙන් ඡන්දය දීම සඳහා හිමිකම් ඇති අයකු බවට නිසැකවීමි.
2. මා*/ ඉල්ලුම්කරු විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතුකොටගෙන මට*/ඔහුට වෙන්කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් මට*/ඔහුට ඡන්දය දීමට නොහැකි*/නොහැකි වීමට ඉඩ ඇති බව මම මෙයින් සහතික කරමි.
3. මෙ ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදිය.
(ඉල්ලුම්කරුගේ අනන්‍යතාව, ජාතික හැඳුනුම්පත හෝ වෙනත් හැඳුනුම්පතක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව හෝ පසුපිටේ සඳහන් කාර්යාලයේ/ආයතනයේ/විද්‍යාලේ ප්‍රධානියාගේ සහතිකය හරහා අනන්‍යතාව පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව ඉල්ලුම්කරුගේ සහතික කිරීමේ නිලධාරියා විසින් අයදුම්පත්‍රය සහතික කිරීමට වග බලා ගත යුතුය).

..........................................................
සහතික කරන නිලධාරියාගේ*/ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: .............................. නම : ..........................................................................
නිල මුද්‍රාව: නිල නාමය : ..........................................................................
දුරකථන අංකය: ........................................ ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

*(අදාළ නොවන වචන කපා හරින්න.)

සහතික කරන නිලධාරියාගේ කේතය | | | | | | | | | | | | | | |

මෙම ආකෘතිය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින්ම ලබාගත හැකිය. ඔබේ අවශ්‍යතාව සඳහා මැතිවරණ කාර්යාලය විමසීම යෝග්‍ය වෙයි.
இப்படிவத்தை சிங்களம், தமிழ், ஆங்கிலம் ஆகிய மூன்று மொழிகளிலும் பெற்றுக் கொள்ள முடியும். உங்கள் தேவைப்பாடு தொடர்பாக தேர்தல்கள் அலுவலகத்துடன் தொடர்பு கொள்ளவும்.
This form is available in Sinhala, Tamil and English Languages. You may contact the Elections Office for your requirement.

සහතික කිරීමේ නිලධාරී,

තැපෑලෙන් ඡන්දය දීම සඳහා පසුපිටේ දැක්වෙන තොරතුරු සපයා ඇති.................................................................

.................................... මයා/මිය/මෙනවිය ජාතික හැඳුනුම්පත් අංක | | | | | | | | | | | | |

අයදුම්කරු මගේ කාර්යාලයේ/ආයතනයේ/ශාඛාවේ/විදුහලේ සේවය කරන බව සහතික කරමි.

.............................................
අත්සන
ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලයේ/ආයතනයේ/
ශාඛාවේ/විදුහලේ ප්‍රධානියා

රාජකාරි ලිපිනය : ........................................ නම : ..............................................................
දුරකථන අංකය : රාජකාරි : ............................ තනතුර : ..............................................................
පෞද්ගලික :...........................

## සටහන

1. සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මැතිවරණයක් පවත්වන ලෙස නියම කරමින් කරන ලද ප්‍රකාශනය හෝ ආඥාව පළ කරනු ලැබූ දිනයේ සිට දින හතකට කලින් නොවන හා දින දහ හතරකට පසුව නොවන දිනයක, ඉල්ලුම්කරු ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි වී සිටින මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක්ම නිසි පරිදි පුරවා තිබිය යුතුය. එසේ නොවුවහොත් තේරීම්භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේය.

3. සෑම ඉල්ලුම්කරුවකුටම තේරීම්භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ, ඔහු එසේ හිමිකම් ලබා නොමැතිනම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5. "සහතික කිරීමේ නිලධරයා" යන යෙදුම -

   (අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට –

      (i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාධිපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාධිපති හෝ ඒ ගුවන් හමුදාවේ හමුදාධිපති නම්, නැතහොත් ඒ ඉල්ලුම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්යභාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ; නැතහොත්

      (ii) ඒ ඉල්ලුම්කරු මේ අනුඡේදයේ (i) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ;

   (ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට -

      (i) ඒ ඉල්ලුම්කරු, යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ; නැතහොත්

      (ii) ඒ ඉල්ලුම්කරු මේ අනුඡේදයේ (i) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින නිලධරයා ඉන් අදහස් වේ;

   (ඇ) මහ මැතිවරණයක අපේක්ෂකයෙකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉල්ලුම්කරු ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ තේරීම්භාර නිලධරයා ඉන් අදහස් වේ.

## උපදෙස්

1. අයදුම්කරු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(2) උප වගන්තිය යටතේ තැපැල් ඡන්දදායකයකු ලෙස සළකනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

2 අයදුම්කරුගේ නම, අදාළ ඡන්දහිමි නාමලේඛනයේ සඳහන් ආකාරයට, අයදුම්පතෙහි නියමිත ස්ථානයේ සඳහන් කිරීම අවශ්‍ය වේ.

3. අයදුම්පතෙහි සඳහන් ලියාපදිංචි විස්තර, නාමලේඛනයේ අදාළ විස්තර සමග නොගැලපුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

4. නියමිත සහතික කිරීමේ නිලධාරිගේ අත්සන, නිල මුද්‍රාව අයදුම්පතේ ඇතුළත් නොවීම සහ අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ එදිනට පෙර අයදුම්පත දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත නොලැබීම, එය ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

5. අවශ්‍ය විස්තර ඇතුළත් කොට අයදුම්පත සම්පූර්ණ කිරීම අයදුම්කරු විසින්ම සිදුකිරීමට වග බලාගත යුතුය.

6. අයදුම්කරුවකු විසින් නාමලේඛනයේ තමාගේ ලියාපදිංචි විස්තර, අදාළ ඡන්දහිමි නාමලේඛනයෙන් උපුටා ගැනීමට පෙර, අදාළ නම ඇතුළත් ගෘහය තම පවුලේ සාමාජිකයන් ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි ගෘහය බවට සෑහීමකට පත්විය යුතුය. එසේ නොවුනහොත් තමාගේ නමට සමාන, ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වෙනත් නමකට අදාළ විස්තර අයදුම්කරු විසින් සිය අයදුම්පතෙහි ඇතුළත් කිරීමට ඉඩ ඇත. එවැනි විස්තර ඇතුළත් අයදුම්පතක් තේරීම්භාර නිලධාරියකු විසින් පිළිගතහොත්, අයදුම්කරු විසින් තමාගේ නමට සමාන වෙනත් නමකට අදාළ පුද්ගලයකු වෙනුවෙන් තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලීම නිසා, වෙනත් අයකුගේ ඡන්දය දීමේ අවස්ථාව අහිමි වී යනු ඇත. එසේ වුවහොත් වැරදි ලෙස තැපැල් ඡන්ද ඉල්ලුම් කරන තැනැත්තන් දඬුවම් ලැබිය හැකි වරදක් කරනු ලැබුවාසේ සැලකෙනු ඇත.

7. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 77 (1) වගන්තිය අනුව ජීවත්ව සිටින හෝ මියගොස් ඇති හෝ ව්‍යාජ වූ හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් තැපෑලෙන් ඡන්දය දීමට පහසුකම් ඉල්ලා සිටීම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ දඬුවම් කළ හැකි, හොර ඡන්දය දීමේ වරදක් වේ.

GCE240005 – 1,400,000 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.